## සොබාදහම

Discovery CHANNEL

# රූපවාහිනී අත්වැල


රූපවාහිනී
ரூபவாஹினி
RUPAVAHINI

## අලින්ගේ අපේ විත්ති

නොවැම්බර ඩිස්කවරියෙන්, කාලෝචිත මෙන්ම අතිශය වැදගත් තේමාවකින් ඉතාම පරස්පර විරෝධී යමක් එකවරටම නැගුණා. ඒ යළි සිහි නැංවීම අපටද වැදගත් යයි සිතෙනවා. අලින් සහ මිනිසුන් අතර සබඳකම්, වල් අලින් සහ හීලෑ අලින් වගේම අවුරුදු 2000 ක් පමණ පෙර කලක සිට එන තායිලන්ත ඇත් උළෙල, අප්‍රිකාවේ ගෝත්‍රික අලි දඩයම්, සහ අලි සර්කස් වගේම ආදි රෝමයේ ග්ලැඩියේටරයින් අලින් මැරූ සැටි සිට ඇත් දළ වෙළඳමේ සිට ඇතුන් සංරක්ෂණය පිළිබඳව කරුණු ඉදිරිපත් වූ බව ඔබට මතක ඇති. සතුන්ගේ දෛවය (Animal destiny) යටතේ මෙන්ම පරිසර අභියෝගය යන පුළුල් තේමාව යටතේ - ඇත්තු - පැවැත්මේ කුලිය - නැත්නම් වන්දිය යන්නෙන් වැදගත් ප්‍රශ්න රාශියක්ම සිත් යොමු කෙරුණා. විනාශයක් මතුකරන වැදගත් ප්‍රශ්න අතරෙන් ප්‍රධාන එකක්, ඇලි ඇතුන්ටත්-මිනිසුන්ටත් එකම පරිසර පද්ධතියක පැවැත්ම ගෙන යාහැකිද? යන්න.

අප්‍රිකානු ඇතාගේ පැවැත්ම තර්ජනයට ලක්ව ඇත. 1989 ඇතත් ගලවාගැනීම සඳහා ජාත්‍යන්තර ඇත්දළ වෙළෙඳම තහනම් කෙරුණා. 1997 දී චිත්‍රපට කරුවෝ දෙදෙනෙක් අප්‍රිකාවේ බටහිර සිට නැගෙනහිර පුරා ගිහින් ඇත්දළ තහනම් වූ අවුරුදු නවය(9) තුළ ඇත් ජනගහනයේ තත්ත්වය අධීක්ෂණයට ලක් කළා. මේ වැඩසටහනින් පිළිතුරු දීමට අපහසු ප්‍රශ්න රාශියක් මතුකෙරුණා. වර්තමාන අප්‍රිකානු ආර්ථිකයන් සැලකිල්ලට ගත්විට, හොරෙන් අලි ඝාතනය කිරීම, ගම්වැසියන්ට වන්දි ගෙවීම, වනෝද්‍යාන පවත්වා ගැනීම කළ හැක්කේ කෙසේද? යහපතටද (වාසියටද) නැතිනම් කුමක් සඳහා ඇත්දළ ඒකරාශීකළ ගබඩාවන් රජයේ වියදමින් නඩත්තු කර ගත යුත්තේද? විශේෂයෙන්ම ආසියාතික ඇත්දළ වෙළෙඳ පොළේ ඇතිවීගත යන වෙනස්කම් සැලකිල්ලට ගත්තම බොහෝ අප්‍රිකානු රටවල අන්ත සාගින්නෙන් පෙළෙන ලක්ෂ සංඛ්‍යාත ජනකායකට වඳවීයාමට ආසන්නයැයි සැලකෙන සතුන්ගේ

# ලොවට අහිමි වී යන සොබා දහමේ අසිරිය



සංරක්ෂණය දරාගත නොහැකි තරම් දෙයක්. දැන් පවත්නා නීතිය අන්තර් ජාතික නීතිය අනුව අලින්ගෙන් ලබාගන්නා ද්‍රව්‍ය හෝ ඒ ද්‍රව්‍යවලින් නිමවන භාණ්ඩ විකිණීම තහනම්. මේ අතර තියහ සහ ඇත් ජනගහනය අධික වීම නිසා, ඇතුන්ගේ ආහාර හා ජල ප්‍රමාණ ක්ෂයවී යන අතරේ, මිනිසුන් හා ඇතුන් අතරෙ සම්පත් සඳහා විශාල තරගයක් ඇතිවෙලා. මේ විනාසයන්ට නැඹුරුවන්නන්ගේ විඥනයට වේදනාකාරී ප්‍රශ්න මතු කෙරුණා. කාර්මික ලෝකයේ ජීවත්වන අය මෙන්ම කාර්මික ලෝකයේ මැවීපෙනෙන සංවර්ධනයත් ස්ථිර සාරයැයි ගෙන ඒවායේ එල ලුහුබැඳයෑමේ ගමනක යෙදී සිටින තුන්වන ලෝකයේ රටවල ජීවත්වන අපද ඉතා තදින් දරා සිටින ආකල්පයක් වඳවීයාම අභාවයට යාම (සතුන්) දැරිය නොහැකිවන මෙන්ම ඉතාම අශිෂ්ඨ තත්වයක්ය යන්න. ඒ එසේවුවත්, ජනගහනය වැඩිවීම නිසා අලින් ඝාතනයයේත්, ගබඩා සංකීර්නවල උතුරායන තරමට ගොඩගසා ඇති ඇත්දළ සම්භාරයෙන් කඩාකප්පල් වූ බිඳ වැටුණු ආර්ථිකයන් නිසා වදවේදනා විඳින මානව සමූහයාගෙන් රූප රාමු, සුවපහසු අසුන් මත ඉඳ නෙල දසුනට (ටෙලිවිෂන) තිරයේ ඇස්යොමා සිටි අපගේ මතකයෙන් නම් මැකී නොගියා පමණක් නොව අප සිත්සතන් තුළ සදාචාර පිළිබඳ විසඳගත නොහැකි ප්‍රශ්න මතුකළේ නැතැයි අපට කිය හැකිද?

ඇත්දළ වෙළඳම පිළිබඳ ලෝපුරා තොරතුරුද ඇතුන් සංරක්ෂණය සඳහා ගන්නා ප්‍රයත්නයද එකට එක සසඳ අප්‍රිකාවේ හාමතේ මරණයේ අබියස ඉන්නා දරුදැරියන් මවුන් පියවරුන් දුටු විට හද සසල කරවන ප්‍රශ්න මතුවුනා නම් පුදුම විය යුතුය.

අවුරුදු අටකට පසු ඇත්දළ වෙළඳම පිළිබඳ පූර්ණ තහනම ලිහිල් කිරීමට කටයුතු දනටමත් ගෙන ඇත. සමහරුන් සිතන පරිදි මේ තීරණය අලි ඇතුන් වඳවීයාමට මෙහෙයවන්නකි. තවත් සමහරුනට ඇතුන් සංරක්ෂණය සඳහා මුදල් ලබාගැනීමට මහත් ලබාදෙනු ඇත.

එකක් නම් සහතිකය. මේ විකාශනය බලා අවසන් වූ විට ඒත්තු ගිය දෙයක් නම් අප්‍රිකාවේ ඇතුන්ගේ පැවැත්ම සඳහා වැයක් ඇත. ප්‍රශ්නය එය ගෙවන්නේ කවුරුන්ද? අන්තර් ජාතික මට්ටමෙන් ගෙවන්නේ කවුරුන්දැයි අසනවිට අපේ රටේ අලි වඳවීයාම වැළැක්වීමට ගෙවන්නේ කවුරුන්දැයි ඇසිය යුතුමය. මෙවැනි දේ අපේ රටෙන් කියවන්නට ලැබෙයි. වනසත්ව ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අනුව 1948 ට පෙර නැගෙනහිර පළාතේ අලින් 3500 ක් පමණ ඝාතනය කර ඇත. ගාල්ල, හම්බන්තොට ප්‍රදේශයේ 1831-1856 අතර අලි ඇතුන් 2000 කට වඩා මරාදමා ඇත. මේ සියවස ඇරඹෙන විට අලිඇතුන් ජනගහනය 25,000 ක් පමණ වී යැයිද, සියවස ගෙවීයන අද දවසේ ජනගහන වාර්තා අනුව 2000-2500 පමණ යැයි පැවසෙයි. ඒ අතර රජය විසින් කැඳවනු ලැබූ ඉන්දියානු විශේෂඥ උපදේශකයෝ වූ අපේ වෙසායි පවසන්නේ පශ්චාත් නිදහස් යුගයේ මහවැලි ආදී සංවර්ධන ව්‍යාපෘති නිසා රටේ ඇත් ජනගහනයට විශාල තර්ජනයක් වූ බවත්, මේ තරම් පරිමානයකින් නිවහන් වෙනස්කිරීමත් අලි ඇතුන්ගේ නිවහන් බිම් බිඳී යාමත් නිසා, මිනිසා හා ඇතුන් අතර මුහුණට මුහුණලා ගැටුම් ප්‍රතිඵලය වී ඇත. මහවැලියේ හා වයඹ පළාතේ අද හටගත ඇති අලි-මිනිස් ගැටුම, කෙටි කාලයන් තුළ ඉඩම් පරිහරණයකට ගැනීමේ ප්‍රතිඵලයක්.